# ජනමාධ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල 2025

## කාණ්ඩ සහ නිර්ණායක ( මුද්‍රිත සහ ඩිජිටල් මාධ්‍ය සඳහා)

ජනමාධ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල - 2025 අයදුම්කරුවන් ඒ සඳහා වන කාණ්ඩ සහ නිර්ණායක සැකෙවින් කියවිය යුතුය. නිවැරදි කාණ්ඩය තෝරාගෙන ඇති බවට සහ නිර්ණායක සපුරා ඇති බව සහතික කර ගැනීම සඳහා ඔබේ කර්තෘ හෝ අංශ ප්‍රධානියාගෙන් විමසන්න. සෑම අයදුම්පතක් ම කර්තෘ විසින් හෝ ඔහු/ ඇය නොමැති නම් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සාමාජිකයෙකු විසින් අත්සන් කළ යුතු ය. අංශ ප්‍රධානීන් විසින් පමණක් අත්සන් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සෑම අයදුම්පතකම අදාළ කාණ්ඩයට අයත් තමාගේ මාධ්‍ය නිර්මාණ (ප්‍රවෘත්ති/ ලිපි/ ඡායාරූප/කාටූන්) පහක් ඉදිරිපත් කළ යුතු ය.

<u>මුද්‍රිත මාධ්‍ය කාණ්ඩය</u>

### මර්වින් ද සිල්වා සම්මානය - (තනි සම්මානය)

ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ ආරම්භක සභාපති, කීර්තිමත් කර්තෘවරයෙකු , තීරු ලිපි රචකයෙකු සහ විදෙස් ප්‍රවෘත්තා වාර්තාකරුවෙක් වූ මර්වින් ද සිල්වා මහතා සිහි කිරීම සඳහා වර්ෂය පුරා පුවත්පත් කලාවේ විශිෂ්ඨත්වය සහ මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම වෙනුවෙන් සම්මානයට පාත්‍ර වෙයි.

ජාතික මෙන්ම සමාජයීය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කළ නිර්මාණශීලීත්වය පෙන්වූම් කළ සහ බලපෑම් සහගත මෙන්ම මනාව පර්යේෂණය කළ සංවේදී ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කළ ශ්‍රී ලාංකික කර්තෘන් සහ මාධ්‍යවේදීන් සඳහා මෙය විවෘතය.

ඔබගේ කාර්යයේ වැදගත්කම පැහැදිළි කරන වචන 250 ක ප්‍රකාශයක් මේ සඳහා ඇතුළත් කළ යුතුය.

### වසරේ ගවේෂණාත්මක මාධ්‍යවේදියා (එක් සම්මානයක් පමණි)

ජාතික වැදගත්මක් ඇති අපරාධ, දූෂණ හෝ ආයතනික වැරදි හෙළිදරව් කරන විමර්ෂණාත්මක වාර්තාවක් හෝ මාලාවක් සම්පාදනය කිරීම ඇගයීම සඳහා පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ප්‍රදානය කෙරේ. විනිශ්චයකරුවන් ගවේෂණයේ ගැඹුර, නිරවද්‍යතාව, වෘත්තීයභාවය සහ සමාජ බලපෑම තක්සේරු කරනු ඇත.(දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රවෘත්ති හා ලිපි පිළිගනු ලැබේ)

කණ්ඩායම් අයදුම්පත් සඳහා වචන 250 ක කර්තෘ සටහනක් අවශ්‍ය වේ.

### වසරේ උණුසුම් පුවත (එක් සම්මානයක් පමණි)

ජාතික බලපෑමක් ඇති ප්‍රධාන සුවිශේෂී පුවතක් ඉදිරිපත් කළ මාධ්‍යවේදියාට හෝ කණ්ඩායමට පිරිනමනු ලැබේ. අයදුම්කරු නියෝජනය කරන මාධ්‍ය ආයතනය විසින් පළමුව ප්‍රකාශයට පත් කරන ලද මුල් පුවතක් විය යුතුය.

ලිපිය මුලින්ම ප්‍රකාශයට පත් කරන ලද බවත් අයදුම්කරු විසින් ම සම්පාදනය කරන ලද්දක් බව සනාථ කරන කර්තෘගේ වචන 250 ක සටහනක් ඇතුළත් කළ යුතු ය.

## වසරේ තරුණ මාධ්‍යවේදියාට පිරිනමන ඩෙන්සිල් පීරිස් සම්මානය (එක් සම්මානයක් පමණි)

ශ්‍රී ලංකාවේ හොඳම සංස්කාරකවරුන්ගෙන් කෙනෙකු වන, ජාත්‍යන්තරව ගෞරවයට පාත්‍ර වූ ඩෙන්සිල් පීරිස් මහතාට ගෞරවයක් වශයෙන් මෙම සම්මානය පිරි නැමේ.
සාධාරණ හා නිවැරදි වාර්තාකරණය සහ විෂය අනුකූලතාවය හරහා සුවිශේෂී හැකියාවන් පෙන්වන වයස අවුරුදු 26 ට අඩු මාධ්‍යවේදීන් සඳහා මෙය විවෘතය. සම්මුඛ සාකච්ඡා මෙහිදී පිළිගනු නොලැබේ.
ජයග්‍රාහකයාට ඉන්දියාවේ ජනමාධ්‍ය විද්‍යාලයේ Manorama School of Communication ශිෂ්‍යත්වයක් පිරි නැමේ. ඒ සඳහා ඉංග්‍රීසි භාෂාවේ නිපුනත්වයක් අවශ්‍ය වේ.

## හොඳම සෞඛ්‍යය වාර්තාකරු (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

සෞඛ්‍යය, වෛද්‍ය සේවා, ප්‍රතිකාර සහ රෝග වැළැක්වීම පිළිබඳව මනා පර්යේෂණයකින් යුතු ප්‍රවෘත්ති/ ලිපි ප්‍රකාශයට පත් කරන මාධ්‍යවේදීන් සඳහා විවෘතයි. අත් පත්‍රිකා හෝ මාධ්‍ය නිවේදනවලින් ඔබ්බට ගොස් , සරල භාෂාවෙන් වෛද්‍ය ගැටළු පැහැදිලි කළ යුතු ය. වෛද්‍යවරු සමග කරන සම්මුඛ සාකච්ඡා අතුලත් කරන්නේ නම් ප්‍රවර්ධන කටයුතුවලට නොව තොරතුරු සඳහා වැඩි ඉඩක් සැපයිය යුතුය.

## වසරේ හොඳම පාරිසරික වාර්තාකරු - (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

පාරිසරික ගැටළු, සංරක්ෂණ කිරීමේ උත්සාහයන්, පරිසර දූෂණය පිළිබඳ හෙළිදරව් කිරීම් සම්බන්ධ ලිපි හෝ මාධ්‍ය නිර්මාණ කළ මාධ්‍යවේදියෙකුට හෝ කණ්ඩායමකට පිරිනමනු ලැබේ.
බලපෑමක් ඇති කළ ගවේෂණ සඳහා විනිසුරුවන් වැඩි අවධානයක් යොමු කරනු ඇත. අදාළ ඉදිරිපත් කිරීම් මනා පර්යේෂණයකින් යුතුව පාරිසරික තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කළ අන්තර්ගතයන් විය යුතුය.

## වසරේ හොඳම ක්‍රීඩා මාධ්‍යවේදියා (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ගවේෂණාත්මක සහ පුළුල් වාර්තා, හෙළිදරව් කිරීම්, සංවාදශීලී සාකච්ඡා මගින් කෂේත්‍රයේ බලපෑමක් කළ ක්‍රීඩා මාධ්‍යවේදියෙකුට මෙම සම්මානය පිරිනැමේ. එය එක් ක්‍රීඩාවක් හෝ කිහිපයක් ආවරණය කළ හැකි අතර මෙම වාර්තා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ පැහැදිළි ලෙස බලපෑමක් වූ සහ බලධාරීන් විසින් යම්කිසි මැදිහත්වීමකට ලක් කළ වාර්තා විනිසුරුවරුන්ගේ අවධානයට ලක්වේ.

## හොඳම නිර්මාණාත්මක පුවත්පත (භාෂා තුනට එක් සම්මානයක් පමණක් පිරි නැමේ)

සදාචාරාත්මක අන්තර්ගතයන් සහ බලපෑම් සහිත, පාඨක හිතකාමී නිර්මාණයක් වීම විනිසුරුවන්ගේ අවධානයට ලක් වෙයි. පිටුසැලසුම, දෘශ්‍ය සමතුලිතතාවය (Visual Balance) වර්ණ භාවිතය, පහසුවෙන් කියවීමේ හැකියාව සහ සමස්ත ආකර්ෂණය තක්සේරු කරනු ඇත. ඉදිරිපත් කිරීම්වලට සත්‍ය පිටපත (Original Newspaper) සමග සම්පූර්ණ පුවත්පත් ඇතුළත් විය යුතය.

## වසරේ හොඳම ව්‍යාපාර මාධ්‍යවේදියා (භාෂා තුනට සම්මාන තුනක් පිරිනැමේ)

මූල්‍ය සහ ආර්ථිකය පිළිබඳ මහජන අවබෝධය වැඩි දියුණු කරන, බලපෑම් සහගත, හොඳින් පර්යේෂණ කරන ලද ව්‍යාපාරික මාධ්‍ය නිර්මාණ නිරන්තරයෙන් ඉදිරිපත් කරන මාධ්‍යවේදියෙකුට පිරිනමනු ලැබේ. ප්‍රවෘත්ති වටිනාකම, මූලාශ්‍ර ඇසුරෙන් කරන ලද ප්‍රවණතා විශ්ලේෂණය, පැහැදිලිභාවය, සදාචාරාත්මක පුවත්පත් කලාවට අනුගත වීම විනිශ්චයකරුවන් විසින් තක්සේරු කරනු ලැබේ. ප්‍රශ්නෝත්තර ආකෘතිවල මාධ්‍ය නිවේදන හෝ සම්මුඛ සාකච්ඡා අදාළ නොවේ.

## වසරේ  හොඳම කාටූන් ශිල්පියා (භාෂා තුනට එක් සම්මානයක් පමණක් පිරි නැමේ)

උපහාසාත්මක කාටූන් හෝ ග්‍රැෆික්ස්  මහජන අවධානය යොමු කරන ජාතික ගැටළු පිළිබඳව සිය නිර්මාණ පළ කළ කාටූන් ශිල්පියෙකුට මෙම සම්මානය පිරිනමනු ලැබේ. භාෂාව ඉක්මවා යන, මහජනතාව නියෝජනය කරන සහ ශක්තිමත් කලාත්මක හා උපහාසාත්මක කුසලතා පිළිබිඹු කරන කාටූන් විනිශ්චයකරුවන්ගේ අවධානයට යොමුවේ.

## වසරේ හොඳම ඡායාරූප මාධ්‍යවේදියා (භාෂා තුනට එක් සම්මානයක් පමණක් පිරි නැමේ)

පැහැදිලි බව, තාක්ෂණික කුසලතාව සහ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුත් බලපෑම්කාරී ඡායාරූප මගින් නිරන්තරයෙන් පාඨකයා ග්‍රහණය කරගත් ඡායාරූප මාධ්‍යවේදියෙකුට පිරිනමනු ලැබේ. සෑම ඡායාරූපයක්ම මුල්, සංස්කරණය නොකළ, සහ ඡායාරූප සටහනක් සහිතව ප්‍රකාශයට පත් කළ ඡායාරූප විනිසුරුවන්ගේ අවධානයට ලක් වෙයි. පළවූ දිනය සහිත මුල් පුවත්පත ඇතුළත් විය යුතුය.

## වසරේ හොඳම තීරු රචකකයාට හිමි බී.ඒ. සිරිවර්ධන සම්මානය (භාෂා තුනට සම්මාන තුනක් පිරිනැමේ)

කර්තෘවරයෙක් මෙන්ම ප්‍රවීන ලේඛකයෙකු වූ බී.ඒ. සිරිවර්ධන මහතා සිහි කිරීම සඳහා මෙම සම්මානය පිරිනමයි.

එහි නිර්භීත, මානව හැඟීම් ආමන්ත්‍රණය කරන, මහජන විවාදයට තුඩු දුන් තීරු ලිපි රචකයෙකුට මෙය පිරිනමනු ලැබේ. තීරු ලිපි (සැබෑ නම හෝ අන්වර්ථ නාමය යටතේ) විය යුතු ය. දිග තීරු එකක් හෝ දෙකකට සීමා විය යුතුය.

වසර තුළ අවම වශයෙන් ප්‍රකාශිත තීරු ලිපි 12 ක් සහ කර්තෘ විසින් තහවුරු කරන ලිපියක් සාක්ෂි ලෙස අවශ්‍ය වේ. අන්වර්ථ නාමයක් භාවිතා කරන්නේ නම්, කර්තෘ විසින් සහතික කළ යුතු ය.

## සමාජ ගැටළු වාර්තාකරණය සඳහා වන සුබ්‍රමනියම් චෙට්ටියාර් සම්මානය (එක් සම්මානයක් පමණි)

වීරකේසරී නිර්මාතෘ සහ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ සුබ්‍රමනියම් චෙට්ටියාර් මහතා සිහි කිරීම සඳහා මෙම සම්මානය පිරි නැමේ.
සාධාරණත්වය සහ සුපිලිපන්භාවයෙන් යුතුව සමාජ ගැටළු නිරන්තරයෙන් ඉස්මතු කරන, හඬක් නැති අයට හඬක් ලබා දෙන මාධ්‍යවේදියෙකුට පිරිනමනු ලබයි. සමාජ බලපෑම පිළිබඳ පැහැදිලි අවධානයක් යොමු කරමින්, පසු විපරම් කතා ද ඇතුළත් විය යුතු ය.

## වසරේ හොඳම විශේෂාංග ලේඛක උපාලි විජේවර්ධන සම්මානය (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

සීමාසහිත උපාලි පුවත්පත් සමාගමේ නිර්මාතෘ උපාලි විජේවර්ධන මහතාට ගෞරවයක් වශයෙන් මෙම සම්මානය පිරි නමනු ලබයි.

මෙම සම්මානය මගින් භාෂා දැනුම, විවිධ ඉදිරිපත් කිරීමේ ශෛලීන් සහ සාධාරණත්වය, නිරවද්‍යතාවය සහ ඉහළ පුවත්පත් ප්‍රමිතීන් පවත්වා ගනිමින් පාඨකයින් ග්‍රහණය කර ගැනීමේ හැකියාව ඇති විශේෂාංග ලේඛකයෙකු හඳුනා ගනී. උනන්දුව ඇත් කරන හෝ පාඨකයා ආකර්ෂණය කරන ඕනෑම මාතෘකාවක් ආවරණය කළ හැකි අතර, ගැටළු මත පදනම් විය යුතු නැත.

## තොරතුරු දැන ගැනීමේ අයිතිය භාවිත කරමින් හොඳම ප්‍රවෘත්ති හෝ විශේෂාංගය සඳහා මහාචාර්ය කයිලාසපති සම්මානය (තනි සම්මානය)

දෙමළ මාධ්‍ය ස්වාධීනත්වය වෙනුවෙන් මහඟු සේවයක් කළ මහාචාර්ය කයිලාසපති මහතාට ගෞරවයක් වශයෙන් මෙම සම්මානය පිරි නැමේ.

මෙම සම්මානය මහජන අවශ්‍යතා පිළිබඳ ගැටළුවක් හෙළිදරව් කිරීමට සහ පිළියම් සෙවීමට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් (RTI) පනත භාවිතා කළ මාධ්‍යවේදියෙකු හෝ කණ්ඩායමක් පිරි නමනු ලබයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය (RTI) භාවිතා කළ ආකාරය පැහැදිලිව සඳහන් කළ යුතුය.

## ඩිජිටල් මාධ්‍ය (පුවත්පත් වෙබ් අඩවි)

### හොඳම නිර්මාණාත්මක වෙබ් අඩවිය (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

හොඳම ව්‍යුහය, දෘශ්‍ය නිර්මාණය, ක්‍රියාකාරීත්වය සහ අන්තර්ක්‍රියාකාරිත්වය සහිත ප්‍රවෘත්ති වෙබ් අඩවියට මෙම සම්මානය පිරිනමනු ලැබේ.
ප්‍රධාන ලක්ෂණ සහ සුවිශේෂී බව පෙන්වන පිටු 10 ( Slide) PDF ඉදිරිපත් කිරීමක් ඇතුළත් කළ යුතු ය.

### හොඳම ඩිජිටල් වීඩියෝ කතාංග (භාෂා තුනට සම්මාන තුනක් පිරි නැමේ)

බලවත් තොරතුරු සහ ආඛ්‍යාන ප්‍රකාශ කිරීම සඳහා ඩිජිටල් වීඩියෝ හෝ සජීවිකරණය භාවිතා කරමින් නව්‍ය ලෙස කතාංග ඉදිරිපත් යුතුය.

(2026 ජූනි 15)